# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 660 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 17/04/2024 පැය 1325

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.04.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වොක්කලාවත්ත ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 25 මිලි ග්‍රෑම් 690 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වූ වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.**

2024.04.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුලස්තිපුර පොලිස් වසමේ පුලස්තිපුර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුලස්තිපුර පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 42 ක් වන පුදුකුඩිරුප්පු පරණගම** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පුලස්තිපුර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. රජයේ කැලයකට අනවසරයෙන් ඇතුළු වී එළි කල සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුර.**

2024.04.16 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හොරොව්පතාන පොලිස් වසමේ කුළුමීමංකඩ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **රජයේ කැළයකට**

**අනවසරයෙන් ඇතුළු වී එහි අක්කර 02 1/2 පමණ ප්‍රදේශයක් එළි කරමින් සිටි** සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන හොරොව්පතාන බීට්ටු වන කාර්යාලය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් **වයස අවුරුදු 34, 35 සහ 42 යන වයස් වල පසුවන ත්‍රිකුණාමලය, වලහවිද්දවැව හා කහටගස්දිගිලිය යන ප්‍රදේශ** වල පදිංචිකරුවන් වේ.

**04. බලපත්‍ර නොමැතිව පස් ප්‍රවාහනය කරන ලද සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2024.04.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සේරුනුවර පොලිස් වසමේ තංගනගර් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍රයක් නොමැතිව ටිපර් රථයකින් පස් ප්‍රවාහනය කරමින් සිටි** සැකකරුවකු අත්අඩංගුවට ගෙන සේරුනුවර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 30ක්** වන **මූතූර් ප්‍රදේශයේ** පදිංචිකරුවෙකි. සේරුනුවර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍රයක් නොමැතිව පස් කැණීම් කර ටිපර් රථයකට පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2024.04.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සේරුනුවර පොලිස් වසමේ තංගනගර් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍රයක් නොමැතිව එක්ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පස් කැණීම් කර ටිපර් රථයකට පටවමින් සිටි** සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන සේරුනුවර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් **අවුරුදු 26 හා 28** වයස් වල **පසුවන සෝමපුර හා මූතූර් ප්‍රදේශයේ** පදිංචිකරුවන් වේ. සේරුනුවර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**